# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 නොවැම්බර් මස 21 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 නොවැම්බර් මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 12.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

## 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 2011 නොවැම්බර් මස 21 වන දින]

එල්.ඩී.—ඕ. 39/2010.

**ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පිහිටුවීම සඳහා ද; ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අරමුණ හා කර්තව්‍ය හඳුනා ගැනීම සඳහා ද; එම අභ්‍යාස ආයතනයේ කළමනාකරණය සහ පරිපාලනය සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතනය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

### I වන කොටස

### ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පිහිටුවීම

2. (1) (මෙහි මින් මතු "අභ්‍යාස ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පොලිස් අභ්‍යාස ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන අභ්‍යාස ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පිහිටුවීම.

(2) (1) වන උපවගන්තිය මගින් එයට ලබා දී ඇති නාමයෙන් අභ්‍යාස ආයතනය සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය; තව ද එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

3. අභ්‍යාස ආයතනය පිහිටුවනු ලබන්නේ යම් අරමුණක් සඳහා ද, එකී අරමුණ ඉටු කර ගැනීම සඳහා අභ්‍යාස ආයතනයේ කාර්යක්ෂම කළමනාකරණය සහ පරිපාලනය සහතික කිරීමේ වගකීම පොලිස් දෙපාර්තමේන්තුවේ පරිපාලනය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා භාරයේ තිබිය යුතු ය. අභ්‍යාස ආයතනය පොලිස් දෙපාර්තමේන්තුවේ පරිපාලනය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ වගකීම විය යුතු බව.

4. අභ්‍යාස ආයතනයේ අරමුණ විය යුත්තේ එයට පුහුණුව සඳහා තෝරා ගනු ලැබූ පොලිස් නිලධරයන්ගේ සහ වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධරයන්ගේ වෘත්තීයමය දැනුම සහ නිපුණතා ඔවුන්ට අදාළ වෘත්තියන්හි උචිත තනතුරුවලට පත්වීම සඳහා වන පරිදි, වැඩිදියුණු කිරීම වේ. අභ්‍යාස ආයතනයේ අරමුණ.

2—PL 006258—3,340 (2011/09)

අභ්‍යාස ආයතනයේ කර්තව්‍ය.

**5.** අභ්‍යාස ආයතනයේ කර්තව්‍ය —

(අ) ශිෂ්‍ය නිලධරයන්ට පොලිස් කාර්යය, නීතිය ක්‍රියාත්මක කිරීම සහ අදාළ විෂයයන් පිළිබඳව උසස් පුහුණුවක් සහ අධ්‍යාපනයක් ලබා දීම;

(ආ) පොලිස් කාර්යය සහ නීතිය ක්‍රියාත්මක කිරීමට ඍජුව ම අදාළ වන කරුණු පිළිබඳව පර්යේෂණ හා අධ්‍යයන පැවැත්වීම; සහ

(ඇ) අදාළ වැඩසටහන් සහ ප්‍රකාශන හරහා අදාළ තැනැත්තන්ගේ අභිවෘද්ධිය සඳහා පොලිස් කාර්යය සහ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව වෘත්තීයමය දැනුම ව්‍යාප්ත කිරීම සහ බෙදා ගැනීම,

විය යුතු ය.

අභ්‍යාස ආයතනයේ බලතල.

**6.** (1) මේ පනතේ 5 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අභ්‍යාස ආයතනයේ කර්තව්‍යවලින් යම් කර්තව්‍යයක් හෝ සියලු ම කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු ක්‍රියා කිරීමට අභ්‍යාස ආයතනයට බලය ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය මඟින් අභ්‍යාස ආයතනය වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගති විරහිතව අභ්‍යාස ආයතනය විසින් —

(අ) අභ්‍යාස ආයතනයේ අධ්‍යයන පාඨමාලා සඳහා ශිෂ්‍ය නිලධරයන් ඇතුළත් කිරීම;

(ආ) ශිෂ්‍ය නිලධරයන්ගෙන් අවශ්‍ය අවස්ථාවන්හි දී නියම කරනු ලැබිය හැකි ගාස්තු අය කිරීම;

(ඇ) තෝරාගත් අධ්‍යයන පාඨමාලා සඳහා ඇතුළත් කරගනු ලබන ශිෂ්‍ය නිලධරයන්ගේ කාර්යක්ෂමතාව ඇගයීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම;

(ඈ) අධ්‍යයන පාඨමාලා සාර්ථක ලෙස අවසන් කිරීමේ දී ශිෂ්‍ය නිලධරයන් වෙත සහතික නිකුත් කිරීම සහ “එන් පී ඒ” (ජාතික පොලිස් අභ්‍යාස ආයතනය) යන ශීර්ෂ නාමය ප්‍රදානය කිරීම;

(ඉ) අදාළ අධ්‍යාපන බලධාරීන්ගේ අනුමැතියට යටත්ව පොලිස් කාර්යය සහ නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ විෂයයන් පිළිබඳව ඩිප්ලෝමා, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය සුදුසුකම් ප්‍රදානය කිරීම;

(ඊ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ද අදාළ දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයේ ද අනුමතයට යටත්ව, එම විශ්වවිද්‍යාලයකට අනුබද්ධ වීම;

(උ) අභ්‍යාස ආයතනයේ කර්තව්‍ය පහසු කරවීම සඳහා සඟරා සහ වෙනත් ලේඛන පළකිරීම සහ බෙදා හැරීම;

(ඌ) අභ්‍යාස ආයතනයේ කර්තව්‍ය පහසු කරවීම සඳහා පොලිස් කාර්යය සහ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම;

(එ) අභ්‍යාස ආයතනයේ කාර්යය සඳහා පුස්තකාල, විද්‍යාගාර සහ වෙනත් ගොඩනැගිලි ඉදි කිරීම, ඒවාට උපකරණ සැපයීම සහ නඩත්තු කිරීම;

(ඒ) අභ්‍යාස ආයතනය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මකවීම සඳහා අවශ්‍ය කථිකාචාර්ය තනතුරු සහ වෙනත් තනතුරු ඇති කිරීම;

(ඔ) අභ්‍යාස ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය සේවා නියුක්තයන් සහ නියෝජිතයන් පත්කිරීම;

(ඕ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම;

(ක) මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලබන ආකාරයට සහ එවැනි ඇප මත අභ්‍යාස ආයතනයේ කාර්යය සඳහා මුදල් ණයට ගැනීම හෝ ඉපයීම;

(ග) මේ පනත මඟින් හෝ යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ අන්‍යාකාරයකට අභ්‍යාස ආයතනය වෙත පැවරී ඇති යම් නිශ්චල හෝ චංචල දේපලක් ලබාගැනීම හෝ දැරීම සහ

එවැනි යම් නිශ්චල හෝ චංචල දේපලක් විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානය කිරීම, පැවරීම, රික්තවරණ කිරීම, වෙන් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකට බැහැර කිරීම;

(ච) අභ්‍යාස ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන සියලු කොන්ත්‍රාත් හෝ ගිවිසුම්වලට ඇතුළත් වී සෘජුව ම හෝ අභ්‍යාස ආයතනය විසින් තත්කාර්යය සඳහා බලය පවරන ලද යම් නිලධරයකු හෝ නියෝජිතයකු හරහා එම කොන්ත්‍රාත් හා ගිවිසුම් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම; සහ

(ජ) අභ්‍යාස ආයතනය විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට එහි අරමුදල් ආයෝජනය කිරීම,

කළ හැකි ය.

II වන කොටස

**අභ්‍යාස ආයතනයේ කළමනාකරණ මණ්ඩලය**

අභ්‍යාස ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය.

**7.** (1) අභ්‍යාස ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම (මේ පනතේ “මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු අතර, එම මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්; එනම්—

(i) සභාපතිවරයා විය යුතු පොලිස් දෙපාර්තමේන්තුවේ පරිපාලනය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ii) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයකුගේ නිලය දරන ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(iii) ලේකම්වරයා විසින් නම් කරනු ලැබිය යුතු පොලිස් දෙපාර්තමේන්තුවේ පරිපාලනය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙක්;

(iv) පොලිස්පතිවරයා; සහ

(v) 13 වන වගන්තිය යටතේ පත් කරන ලද අභ්‍යාස ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා.

(ආ) අමාත්‍යවරයා විසින් ලේකම්වරයා විමසා පත්කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්; ඔවුන් ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව, නීතිය සහ රාජ්‍ය පරිපාලනය වැනි ක්ෂේත්‍රවල ඔප්පු කරන ලද හැකියාවන් ඇති තැනැත්තන් විය යුතු ය.

(2) මණ්ඩලයේ සියලු රැස්වීම්වල දී සභාපතිවරයා මුලසුන දැරිය යුතු අතර, මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විට (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන උපඡේදයේ සඳහන්, (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (iii) වන උපඡේදයේ සඳහන් සහ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් වන්නා වූ ද සභාපතිවරයා විසින් යථා පරිදි නම් කරනු ලැබුවා වූ ද, මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් යම් තැනැත්තෙක් එම රැස්වීමේ දී මුලසුන දැරිය යුතු ය.

(3) අභ්‍යාස ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා මණ්ඩලයේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය.

අභ්‍යාස ආයතනයේ මුද්‍රාව.

8. (1) අභ්‍යාස ආයතනයේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) අභ්‍යාස ආයතනයේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අභ්‍යාස ආයතනයේ මුද්‍රාව සභාපතිවරයා සහ මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු ඉදිරිපිට දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් එම දෙදෙනා එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය:

එසේ වුව ද, අභ්‍යාස ආයතනයේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු ලබන අවස්ථාවේ දී සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකි නම්, තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින්

ලිඛිතව බලය පවරනු ලබන මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට මේ උපවගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවලට අනුකූලව එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබීමට බලය ඇත්තේ ය.

(4) අභ්‍යාස ආයතනයේ මුද්‍රාව තබනු ලබන සියලු සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් අභ්‍යාස ආයතනය විසින් පවත්වාගෙන යා යුතු ය.

අභ්‍යාස ආයතනයේ ඇතුළත ශාඛා.

9. මණ්ඩලය විසින් කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන ශාඛාවලින් අභ්‍යාස ආයතනය සමන්විත විය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම් සහ එම රැස්වීම්වල ගණපූරණය.

10. (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වල දී සිදු කරනු ලබන කටයුතු මණ්ඩලය විසින් පාලනය කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක දී සාමාජිකයන් පස් දෙනකුගෙන් ගණපූරණය සමන්විත විය යුතු ය.

සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම හේතු කොටගෙන මණ්ඩලයේ කටයුතු බල රහිත නොවිය යුතු බව.

11. මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා ම නැතහොත් එහි සාමාජිකයන් පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා ම මණ්ඩලයේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

වාර්ෂික ඇස්තමේන්තු.

12. අභ්‍යාස ආයතනය සඳහා අවශ්‍ය අයවැය මුදල් වෙන් කිරීම් ලබා ගැනීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින් පොලිස් දෙපාර්තමේන්තුවේ පරිපාලනය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා වාර්ෂික ඇස්තමේන්තු හෝ පරිපූරක ඇස්තමේන්තු භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලය

විධායක අධ්‍යක්ෂවරයා.

13. (1) (මෙහි මින් මතු "විධායක අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අභ්‍යාස ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා

වශයෙන් යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු අතර, ඔහු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හෝ නියෝජ්‍ය පොලිස්පති ධුරය දරන සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ නිලධරයකු විය යුතු ය.

(2) විධායක අධ්‍යක්ෂවරයා පත්කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුතු අතර, ඔහු විශ්‍රාම යෑම, මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා කලින් ධුරය අත්හළහොත් මිස, නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙක් විය යුතු ය.

(3) විධායක අධ්‍යක්ෂවරයා විසින් පොලිස් දෙපාර්තමේන්තුවේ පරිපාලනය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා අමාත්‍යවරයා වෙත තත්කාර්යය සඳහා ඉදිරිපත් කරනු ලබන ලිඛිත සන්දේශයක් මගින් විධායක අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලැබුවහොත් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් හේතු දක්වා විධායක අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වූ නියමයක් කරනු ලැබ ඇති විධායක අධ්‍යක්ෂවරයා විසින්, එම නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින හෝ එම නියමයේ නිශ්චිතව සඳහන් වෙනත් යම් දිනයක දී හෝ ධුරය අත්හළ යුතු ය.

(6) විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් පත්කරනු ලැබූ යම් තැනැත්තකු —

(අ) විධායක අධ්‍යක්ෂ ධුරයේ කාලය අවසන්වීමට පෙර එම ධුරය අත්හළහොත් හෝ තමා සාමාජිකයකු වූ පොලිස් දෙපාර්තමේන්තුවේ සාමාජිකයකු වීම අවසන් වුවහොත් අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් සුදුසුකම්ලත් නිලධරයකු පත්කරනු ලැබිය යුතු අතර, ඔහු කලින් ධුරය අත්හළහොත් මිස, ඔහු පත්කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුතු අතර, නැවත පත් කිරීම සඳහා ද ඔහු සුදුස්සකු වන්නේ ය; හෝ

(ආ) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැර සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුට ස්වකීය ධුරයේ කර්තව්‍ය තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වුවහොත් අමාත්‍යවරයා

විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් එම කාලසීමාව තුළ වැඩ බැලීම සඳහා අභ්‍යාස ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරි තනතුර දරන තැනැත්තා පත්කරනු ලැබිය යුතු ය.

විධායක අධ්‍යක්ෂවරයාගේ කාර්යය.

**14.** (1) විධායක අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට සහ පාලනයට යටත්ව අභ්‍යාස ආයතනයේ කටයුතු මෙහෙයවීම සහ අභ්‍යාස ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම භාරව සිටිය යුතු ය. ඔහු අභ්‍යාස ආයතනයේ සේවානියුක්තයන්ගේ සහ ශිෂ්‍ය නිලධරයන්ගේ සමස්ත පරිපාලනය සහ විනය පාලනය භාරව සිටිය යුතු ය.

(2) විධායක අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ අනුමතය ඇතිව ඔහුගේ යම් කාර්යයන් ඔහු විසින් කලින් කලට අවශ්‍ය යැයි සලකනු ලබන ලෙස අභ්‍යාස ආයතනයේ යම් සේවානියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි ය. එසේ කාර්යය පවරනු ලැබූ යම් සේවානියුක්තිකයකු විසින් විධායක අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට යටත්ව එම කාර්යය ඉටු කළ යුතු ය. එසේ පැවරීම නොතකා, අවශ්‍ය අවස්ථාවන්හි දී එම කාර්යයන් දිගට ම ඉටු කිරීමට විධායක අධ්‍යක්ෂවරයාට බලය ඇත.

(3) විධායක අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලය විමසා අභ්‍යාස ආයතනය විසින් ශිෂ්‍ය නිලධරයන්ට සැපයිය යුතු වෛද්‍ය, ශුභ සාධන සහ ක්‍රීඩාමය පහසුකම් තීරණය කළ හැකි ය.

(4) විධායක අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ අනුමතය ඇතිව අභ්‍යාස ආයතනයේ ආරක්ෂාව සහ රැකවරණය සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය හැකි ය.

අභ්‍යාස ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා.

**15.** (1) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයක් සඳහා අභ්‍යාස ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා ලෙස කටයුතු කිරීමට නියෝජ්‍ය පොලිස්පති ධුරය හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ධුරය දරන නිලධරයකු පත්කරනු ලැබිය යුතු ය.

(2) අභ්‍යාස ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා තත්කාර්යය සඳහා විධායක අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන නියෝගයන්ට අනුකූලව අභ්‍යාස ආයතනයේ කටයුතු අධීක්ෂණය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පහසු කිරීම සඳහා විධායක අධ්‍යක්ෂවරයාට වගකිව යුතු ය.

16. මණ්ඩලය විසින් මේ පනතේ විධිවිධානවලට යටත්ව—

අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලය පත්කිරීම සහ කොන්දේසි.

(අ) අභ්‍යාස ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන නිලධරයන් හා සේවකයන් පත්කිරීම ද, එම නිලධරයන් හෝ සේවකයන් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ඔවුන් සේවයෙන් නෙරපීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම ද;

(ආ) එම නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික අනුප්‍රමාණ නියම කිරීම ද ;

(ඇ) එම නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ සේවයට අදාළ නියම හා කොන්දේසි නිශ්චය කිරීම ද; සහ

(ඈ) එම නිලධරයන් හෝ සේවකයන්ගේ අභිවෘද්ධිය සඳහා අදාළ වන අවස්ථාවන්හි දී අර්ථසාධක අරමුදල් හෝ යෝජනාක්‍රම පිහිටුවා පාලනය කිරීම ද, එවැනි අරමුදල් හෝ යෝජනාක්‍රමවලට දායක මුදල් ගෙවීම ද,

කළ හැකිය.

17. (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි රජයේ සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා, අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකිය; එසේ ම එවැනි ම කැමැත්ත ඇතිව ඔහු අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත්කරනු ලැබිය හැකි ය.

අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් යනාදිය පත් කිරීම.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු අභ්‍යාස ආයතනය විසින් එහි සේවයේ නියුක්ත කරන අවස්ථාවක දී එම තැනැත්තා විසින් අභ්‍යාස ආයතනයේ සේවය කරන සේවා කාලය එම ගිවිසුමේ වගකීම ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පරිදි යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු එම නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සහ එම උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකිය; තව ද එම නිලධරයා හෝ සේවකයා, විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල්වල අයිතිවාසිකම්වලට අදාළ කොන්දේසි ඇතුළු වන පරිදි, මණ්ඩලය හා එම ප්‍රධාන විධායක නිලධරයා අතර එකඟවිය හැකි කොන්දේසි මත එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබිය හැකි ය.

(6) යම් උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක දී ඔහු එම කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

## IV වන කොටස

### අභ්‍යාස ආයතනයේ අධ්‍යයන මණ්ඩලය සහ විනය මණ්ඩලය

අභ්‍යාස ආයතනයේ අධ්‍යයන මණ්ඩලය.

18. (1) ශාස්ත්‍රීය සහ වෘත්තීයමය අධ්‍යයනයන්ට අදාළ අභ්‍යාස ආයතනයේ කටයුතු අධ්‍යයන මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු ය. අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) විධායක අධ්‍යක්ෂවරයා;

(ආ) අභ්‍යාස ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා;

(ඇ) මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක්;

(ඈ) අභ්‍යාස ආයතනය යම් විශ්වවිද්‍යාලයකට අනුබද්ධ කරනු ලැබ ඇත්තේ නම් එම විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා විසින් නම් කරනු ලබන යම් නියෝජිතයෙක්; සහ

(ඉ) අභ්‍යාස ආයතනයේ විවිධ ශාඛාවල ප්‍රධානීන්.

(2) මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට සහ පාලනයට යටත්ව සහ මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා සාදනු ලබන රීතිවලට යටත්ව අධ්‍යයන මණ්ඩලය වෙත පවරා ඇති හෝ ලබා දී ඇති කර්තව්‍ය එම අධ්‍යයන මණ්ඩලය විසින් ඉටු කරනු ලැබිය යුතු ය.

(3) අභ්‍යාස ආයතනයේ ඉගැන්වීම, පුහුණුව, පර්යේෂණ සහ විභාග සම්බන්ධයෙන් අධ්‍යයන මණ්ඩලයට පාලනය සහ සාමාන්‍ය විධානය ඇත්තේ ය.

(4) පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම අධ්‍යයන මණ්ඩලය භාරයේ පැවතිය යුතු ය:—

(අ) අභ්‍යාස ආයතනය විසින් පවත්වනු ඇති අධ්‍යයන පාඨමාලා සහ එහි විෂය මාලා හඳුනාගෙන ඒවා මණ්ඩලය වෙත නිර්දේශ කිරීම;

(ආ) අභ්‍යාස ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රදානය කළ යුතු උපාධි, ඩිප්ලෝමා, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිළිබඳව තීරණය කිරීම;

(ඇ) එම උපාධි, ඩිප්ලෝමා, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා සුදුසුකම් ලැබීමට අදහස් කරන ශිෂ්‍යයන් විසින් ලබාගත යුතු පුහුණුව, සමත් විය යුතු විභාග සහ සපුරාලිය යුතු වෙනත් කොන්දේසි හඳුනා ගැනීම;

(ඈ) මණ්ඩලය විසින් යොමුකරන ලද යම් කරුණක් පිළිබඳව සලකා බලා වාර්තා කිරීම;

(ඉ) අභ්‍යාස ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩසටහන්, පර්යේෂණ වැඩසටහන් හෝ විභාග සම්බන්ධයෙන් වන කරුණු පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ හා වාර්තා ඉදිරිපත් කිරීම;

(ඊ) යම් විශේෂ විෂයයක් හෝ විෂය පිළිබඳව සලකා බලා වාර්තා කිරීමේ කාර්යය සඳහා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත්කිරීම;

(උ) පහත දැක්වෙන කරුණු පිළිබඳව මණ්ඩලයට නිර්දේශ කිරීම:—

(i) අධ්‍යයන පාඨමාලා සහ විභාග සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සඳහා වන අවශ්‍යතා;

(ii) ගුරුවරුන් හෝ විභාග පරීක්ෂකයන් වශයෙන් පිළිගැනීම සඳහා සුදුසු තැනැත්තන්;

(iii) නියමිත විභාග සමත්වී වෙනත් නියමිත කොන්දේසි සපුරා ඇති තැනැත්තන් ඩිප්ලෝමා, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා සුදුසුකම් ලැබීම;

(ඌ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා වූ තරගයේ ස්වභාවය හා කොන්දේසි හඳුනාගැනීම; සහ

(එ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා සුදුසු තැනැත්තන් නම් කිරීම.

විනය මණ්ඩලය.

**19.** මණ්ඩලය විසින් විධායක අධ්‍යක්ෂවරයා විමසා පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විනය මණ්ඩලයක් පත්කරනු ලැබිය යුතු ය:—

(අ) අභ්‍යාස ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධරයා; සහ

(ආ) අදාළ විෂමාචාරය එලදායි ලෙස විසඳීම සඳහා අවශ්‍ය යයි විධායක අධ්‍යක්ෂවරයාගේ මතය අනුව අවශ්‍ය වන වෙනත් නිලධරයන්.

විනය සංග්‍රහය සහ එම සංග්‍රහය අදාළ කරගැනීම.

**20.** (1) සෑම ශිෂ්‍ය නිලධරයෙක් ම අභ්‍යාස ආයතනයේ විනය සංග්‍රහයට යටත් විය යුතු ය. එම විනය සංග්‍රහය නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(2) විනය සංග්‍රහය කඩකර ඇති බවට තීරණය කරනු ලබන යම් ශිෂ්‍ය නිලධරයකුගේ හෝ විනය මණ්ඩලය විසින් යම් කඩ කිරීමක් සම්බන්ධයෙන් වරදකරු වන යම් ශිෂ්‍ය නිලධරයකුගේ ක්‍රියාකලාපය අභ්‍යාස ආයතනයේ උපරිම යහපතට සුදුසු නොවන බවට විනය මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබීමේ දී එම නිලධරයා විධායක අධ්‍යක්ෂවරයා විසින් අධ්‍යයන පාඨමාලාවෙන් ඉවත් කිරීමට යටත් වන්නේ ය.

(3) අදාළ ආයතනයට අදාළ වන නීති සහ නියෝග ප්‍රකාරව අවශ්‍ය යයි සලකනු ලබන විනය ක්‍රියා මාර්ගයක් ආරම්භ කිරීම සඳහා ශිෂ්‍ය නිලධරයන්ගේ සෑම විෂමාචාර ක්‍රියාවක් ම විධායක අධ්‍යක්ෂවරයා විසින් ශිෂ්‍ය නිලධරයාගේ ආයතනයේ ප්‍රධානියා වෙත වාර්තා කළ යුතු ය.

(4) සිතාමතා හෝ නොසැලකිලිමත් ලෙස රජයේ දේපලවලට අලාභ සිදුකිරීම සඳහා වගකිව යුතු බවට තීරණය කරනු ලබන යම් ශිෂ්‍ය නිලධරයෙක් එම අලාභය සඳහා අභ්‍යාස ආයතනය හානිපූරණය කිරීමට යටත් වන්නේ ය.

අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයේ විනය පාලනය.

**21.** (1) අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයේ විනය පාලනය විධායක අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා බලය පවරන ලද අභ්‍යාස ආයතනයේ වෙනත් යම් නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයේ විනය පාලනය පවත්වාගෙන යාම මණ්ඩලය විසින් සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව සිදු කළ යුතු ය.

## V වන කොටස

## මුදල්

අභ්‍යාස ආයතනයේ අරමුදල.

**22.** (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අරමුදල" නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අරමුදල කළමනාකරණය කිරීමට, පාලනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය.

අරමුදලට මුදල් ගෙවීම.

**23.** පහත දැක්වෙන මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය:—

(අ) අභ්‍යාස ආයතනයේ කළමනාකරණය සහ පරිපාලනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ශ්‍රී ලංකාව හෝ ඉන් පිටත යම් ප්‍රභවයකින් අභ්‍යාස ආයතනයට ලැබෙන සියලු මුදල්;

(ඇ) අභ්‍යාස ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සම්බන්ධයෙන් ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල්; සහ

(ඈ) අභ්‍යාස ආයතනය විසින් සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අභ්‍යාස ආයතනයට ලැබෙන සියලු මුදල්.

අරමුදලින් මුදල් ගෙවීම.

**24.** පහත දැක්වෙන මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) අභ්‍යාස ආයතනය පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වියදම්;

(ආ) බාහිර කථිකාචාර්යවරුන් සඳහා ගාස්තු ගෙවීම; සහ

(ඇ) අභ්‍යාස ආයතනයේ අරමුණ ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු ගෙවීම්.

ගිණුම් විගණනය කිරීම.

**25.** (1) නිසි පරිදි ගිණුම් පොත් තැබීමට සහ සියලු ආදායම් සහ වියදම් පිළිබඳව ද, වත්කම් හා බැරකම් පිළිබඳව ද, වෙනත් සියලු මූල්‍ය ගනුදෙනු පිළිබඳව ද ගිණුම් තැබීමට 26 වන වගන්තිය ප්‍රකාරව පත්කරන ලද ගණකාධිකාරිවරයාට මණ්ඩලය විසින් විධාන කළ යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අභ්‍යාස ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) අභ්‍යාස ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(4) අභ්‍යාස ආයතනයේ වාර්ෂික ගිණුම් ගණකාධිකාරිවරයා විසින් පිළියෙළ කරනු ලැබිය යුතු අතර ඔහු විසින් එම ගිණුම් විධායක අධ්‍යක්ෂවරයා හරහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**26.** (1) මණ්ඩලය විසින් අභ්‍යාස ආයතනය සඳහා ගණකාධිකාරිවරයකු පත්කරනු ලැබිය යුතු ය. ගණකාධිකාරිවරයකු පත්කිරීම.

(2) 22 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අභ්‍යාස ආයතනයේ අරමුදල පරිපාලනය කිරීම සහ පාලනය කිරීම සඳහා ද අරමුදලේ වෙනත් මූල්‍ය කරුණු සඳහා ද, ගණකාධිකාරිවරයා අභ්‍යාස ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයාට වගකිව යුතු ය.

**27.** (1) ඔවුන්ට අදාළ වන ආයතනික ගෙවීම් නියෝගවල සඳහන් කර ඇති වැටුප් සහ දීමනා ලබා ගැනීමට අභ්‍යාස ආයතනයේ සියලු ශිෂ්‍ය නිලධරයන්ට සහ කාර්ය මණ්ඩලයට හිමිකම් ලැබිය යුතු ය. පාරිශ්‍රමික ගෙවීම.

(2) අදාළ ආයතනය යටතේ දැනට පවත්නා පුහුණු ආයතනවලට පත්කර ඇති තැනැත්තන්ට ගෙවනු ලබන යම් අතිරේක දීමනා ලබා ගැනීමට ඉහත සඳහන් අභ්‍යාස ආයතනයේ සියලු තැනැත්තන්ට හිමිකමක් ලැබිය යුතු ය.

(3) මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන වෙනත් අතිරේක දීමනා ලබා ගැනීමට ඉහත සඳහන් අභ්‍යාස ආයතනයේ සියලු තැනැත්තන්ට හිමිකමක් ලැබිය යුතු ය.

(4) විශ්‍රාම වැටුප්, පාරිතෝෂික දීමනා සහ වෙනත් දීමනාවල කාර්ය සඳහා අභ්‍යාස ආයතනය තුළ දී ශිෂ්‍ය නිලධරයකුගේ පුහුණු කාලය පිළිගත හැකි සේවා කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**28.** මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පැවරී ඇති කර්තව්‍ය ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය මුදල් ණයට ගනු ලැබිය හැකි ය. මණ්ඩලයේ ණය ගැනීමේ බලතල.

## VI වන කොටස

### සාමාන්‍ය

මණ්ඩලය විසින් රීති සෑදීම.

**29.** (1) අභ්‍යාස ආයතනය විසින් ශිෂ්‍ය නිලධරයන් සඳහා පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සම්බන්ධයෙන් විධායක අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම එය සෑදීමෙන් පසු අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු අතර ඉන්පසු ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

නියෝග.

**30.** (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා මේ පනත මඟින් නියම කිරීමට නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය පවරා ඇති හෝ නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මඟින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගති විරහිතව පහත දැක්වෙන සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) අභ්‍යාස ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම;

(ආ) විනය රීති සංග්‍රහය සකස් කිරීම; සහ

(ඇ) නියම කිරීමට ඇති හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කාරණා හෝ පනත මඟින් විධිවිධාන සලසා නොමැති කාරණා සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයාගේ මතය අනුව මේ පනත නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාරණා සම්බන්ධයෙන්.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ අභ්‍යාස ආයතනයේ විධානය මත කරන ලද යම් ක්‍රියාවක් සඳහා ආරක්ෂාව.

31. (1) (අ) මේ පනත යටතේ අභ්‍යාස ආයතනය විසින් සද්භාවයෙන් කරන ලද හෝ උද්දේශිත පරිදි කරන ලද යම් ක්‍රියාවක් සඳහා අභ්‍යාස ආයතනයට එරෙහිව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ අභ්‍යාස ආයතනයේ විධානය මත අභ්‍යාස ආයතනයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ උද්දේශිත පරිදි කරන ලද යම් ක්‍රියාවක් සඳහා එම තැනැත්තාට එරෙහිව,

කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අභ්‍යාස ආයතනය විසින් හෝ එයට එරෙහිව යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අභ්‍යාස ආයතනය විසින් දරන ලද වියදම් සහ එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී අභ්‍යාස ආයතනය විසින් ගෙවන ලද හෝ අයකර ගන්නා ලද නඩු ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ අභ්‍යාස ආයතනයේ විධානය මත (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ උද්දේශිත පරිදි කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට දී ඔහුට එරෙහිව පවරා ඇති සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් එම ක්‍රියාව සිදු කරනු ලැබුවේ සද්භාවයෙන් බවට අධිකරණය තීරණය කළහොත්, එකී වියදම් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකරගනු ලැබුවේ නම් මිස, එකී මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් සහ අභ්‍යාස ආයතනයේ නිලධරයන් සහ සේවකයන් රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**32.** මණ්ඩලයේ සාමාජිකයන් සහ අභ්‍යාස ආයතනයේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යය සඳහා සහ එහි අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අභ්‍යාස ආයතනය උපලේඛනගත ආයතනයක් බවට සැලකිය යුතු බව.

**33.** අල්ලස් පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා අභ්‍යාස ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එකී පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

1978 අංක 16 දරන පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

**34.** 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන මේ පනත මගින් පිහිටුවන ලද අභ්‍යාස ආයතනයට හෝ ඊට අදාළ නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල පාඨය බලපැවැත්විය යුතු බව.

**35.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථනිරූපණය.

**36.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"ශාඛාව" යන්නෙන්, යම් විශේෂිත විෂයයකට හෝ ක්ෂේත්‍රයකට අදාළව විශේෂ පුහුණුවක් ලබාදීම සඳහා අභ්‍යාස ආයතනයේ වගකිව යුතු අංශයක් අදහස් වේ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක්, සරසවියක්, විවෘත විශ්වවිද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාල කොලීජියක් අදහස් වේ;

"නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධරයන්" යන්නෙන්, තමන් වෙත නීති ක්‍රියාත්මක කිරීමේ වගකීම ව්‍යවස්ථාපිතව පවරා ඇති යම් සංවිධානයක නිලධරයකු අදහස් වේ;

"පොලිස් දෙපාර්තමේන්තුව" යන්නෙන්, පොලිස් ආඥා පනත (II පරිච්ඡේදය) යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව අදහස් වේ;

"ප්‍රධාන විධායක නිලධරයා" යන යෙදුමට අදාළ ව—

(i) විශ්වවිද්‍යාලය යන්නෙන් එම විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා අදහස් වේ;

(ii) විවෘත විශ්වවිද්‍යාලය යන්නෙන් එම විවෘත විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා අදහස් වේ; සහ

(iii) විශ්වවිද්‍යාලයීය කොලීජිය යන්නෙන් එම විශ්වවිද්‍යාලයීය කොලීජියේ අධ්‍යක්ෂවරයා අදහස් වේ; සහ

"ශිෂ්‍ය නිලධරයන්" යන්නට—

පුහුණු සහ අධ්‍යයන සඳහා අභ්‍යාස ආයතනයට ඇතුළත් කරනු ලබන පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධරයන්, රජයේ නිලධරයන්, ශ්‍රී ලංකාවේ පවතින වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල නිලධරයන් සහ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි පොලිස් සේවාවල සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල නිලධරයන් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.